# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2273/34 – 2022 මාර්තු මස 29 වැනි අඟහරුවාදා – 2022.03.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 93 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/13/2020/PC/287.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඉඅ/5/1/279.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, පානදුර.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 689, කළුඳැවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කළුඳැවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ka/PAN/2021/114 හා 2021.03.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයෙන් දැක්වෙන ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර "A" - එළුවිල වෙල - ප්‍රමාණය: හෙක්. 1.1924**

උතුරට: කැබලි අක්ෂර B; නැගෙනහිරට: මැල්වත්ත පාර, බර්ට් ප්‍රනාන්දු, ධනපාල ෆොන්සේකා හිමිකම් කියන මැල්මියර් වත්ත සහ රුක්මල් මොරමුදලි හිමිකම් කියන දවටගහවත්ත; දකුණට: බර්ට් ප්‍රනාන්දු, ධනපාල ෆොන්සේකා හිමිකම් කියන මැල්මියර් වත්ත සහ රුක්මල් මොරමුදලි හිමිකම් කියන දවටගහවත්ත සහ ඌෂා දමයන්ති අබේවර්ධන විජේනායක හිමිකම් කියන එළුවිල වෙල; බටහිරට: සයිමන් සිල්වා, චාර්ලිස් සිල්වා සහ තවත් අය හිමිකම් කියන එළුවිල වෙල.

02. **කැබලි අක්ෂර "B" - එළුවිල වෙල - ප්‍රමාණය: හෙක්. 0.0104**

උතුරට: ඇළ; නැගෙනහිරට: මැල්වත්ත පාර; දකුණට: කැබලි අක්ෂර A; බටහිරට: සයිමන් සිල්වා, චාර්ලිස් සිල්වා සහ තවත් අය හිමිකම් කියන එළුවිල වෙල.

EOG 03 - 1050

1A – G 36497 – 20 (2022/03)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*